# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1692/22 – 2011 පෙබරවාරි 10 වැනි බ්‍රහස්පතින්දා – 2011.02.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: පිබැ/ඉ/අප/1/20.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරවක් කෝරලේ වැලිව ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක මාර/පිටිබි/ 2010/261 සහ 2007.09.27 දින දරන අ.ග.පි. 10 දරන පිඹුරු පත්‍ර අංක 98 අතිරේඛ 84හි හෙක්. 0.5909 ක් පමණ වූ කැබලි අංක 1652 වශයෙන් සඳහන් පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණ වලින් යුත් ඉඩම් කැබැල්ලට මායිම්

01. **කැබලි අංක 1652– බඩහැලලියද්ද – ප්‍රමාණය: හෙක්. 0.5909**
උතුරට: කැබලි අංක 154; නැගෙනහිරට: කැබලි අංක 154 සහ 156; දකුණට: කැබලි අංක 154, 156 සහ මාර්ගය; බටහිරට: කැබලි අංක 154.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 මාර්තු මස 21 වැනි දින පූ.භා. 10.00 ට පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2011 මාර්තු මස 14 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කේ. ජී. ආර්. ජයනාත්
ප්‍රාදේශීය ලේකම්,
පිටබැද්දර

2011 පෙබරවාරි මස 03 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පිටබැද්දර
02 - 653

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉඩම් අමාත්‍යාංශයේ අංකය: එල්ඩී/05/2003/එච්ඩබ්ලිව්/531.
යොමු අංකය: කැප්‍රාලේ/අත්3/1/45.

2010 සැප්තැම්බර් මස 03 වැනි දිනැති අංක 1669/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පලකරන ලද දැන්වීමේ සඳහන් මා සම්මුඛ විය යුතු දිනය සහ අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු දිනය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දී සිටිමි

කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ වියයුතු දිනය 2011.02.25 ලෙසත්, අයිතිවාසිකම් ඉදිරිපත් කළයුතු දිනය 2011.02.18 ලෙසත් මෙයින් නිවේදනය කරමි.

එල්. ඒ. කළුකපුආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
කැස්බෑව.

2011 පෙබරවාරි මස 07 වැනි දින,
කැස්බෑව. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී.
02 - 652

1A – G 14139 – 360 (2011/02)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.